

# මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනය

**(දෙපාර්තමේන්තු විද්වත් කමිටුව විසින් දින 07 ක සුසංවේද කථීකා මඟින් ඉදිරිපත් කරන යෝජනාවලිය)**

---

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
තරුණ සහ ක්‍රීඩා අමාත්‍යංශය

**2021**

# පටුන


**ප්‍රවේශය**
පිටුව 02

**මුල් ළමාවිය අර්ථකථනය**
පිටුව 03

**මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය**
පිටුව 03

**21 සියවසේ අධ්‍යාපනය සහ අධ්‍යාපන තේමා**
පිටුව 03

**ධරණීය සංවර්ධනය සඳහා අධ්‍යාපනය**
පිටුව 04

**ගුණාත්මක අධ්‍යාපනය සහ ඉගැන්වීමේ ක්‍රමවේදය**
පිටුව 04

**ඉගැනුම් පරිසරය**
පිටුව 04

**පෙර පාසල් අධ්‍යාපනය**
පිටුව 05

**ගැටලු සහ දුර්වලතා**
පිටුව 05

**පිළියම් සහ යෝජනා**
පිටුව 05

**අවධානය සඳහා**
පිටුව 06

**විද්වත් කමිටුව**
පිටුව 07

**සහභාගිත්වය**
පිටුව 07

# මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනය

## ප්‍රවේශය

දහඅටවන සියවස තෙක් වයස අවුරුදු 3-5 අතර දරුවන්ට අධ්‍යාපනයක් ලබා දෙන ශික්ෂණවිද්‍යා pedagogy ක්‍රමවේදයක් ගෝලීය වශයෙන් දක්නට නොවීය. දරුවා නිවසේ දී පවුලේ සාමාජිකයන් අනුකරණයෙන් සහ අවට පරිසරයේ නෙත ගැටෙන දිසිරූප Visual සහ ශබ්ද අවබෝධ කරගැන්මට ස්වයං උත්සහයක යෙදෙමින් මනස වර්ධනය කරගැනීමට වෙහෙසෙයි. එය " බහ තෝරන" වයස යැයි ජනප්‍රවාදයේ සඳහන් වේ. ඇතැම්විට වැඩිහිටියෝ ඔහුට හෝ ඇයට ඒ සඳහා සහාය වෙති. මුල් ළමාවිය අධ්‍යාපනය යනු ගෝලීය සම්මතයට අනුව වයස අවුරුදු 3-6 අතර කුඩා දරුවන් සඳහා වෘත්තීය පුහුණුව ලත් මනා ශික්ෂණයෙන් යුතු පුද්ගලයන් (ගුරුවරුන්) විසින් මෙහෙයවනු ලබන පාසල් අධ්‍යාපන ක්‍රමයකි. එහෙත් ඇතැම් තැනක වයස අවුරුදු 2-5 අතර ළමුන් ද අධ්‍යාපනය සඳහා මෙහෙයවයි. පෙර පාසල දිවා සුරැකුම් මධ්‍යස්ථානයට වඩා වෙනනස්වන්නේ එය අධ්‍යාපනික අවශ්‍යතාවක් වෙනුවෙන් පෙනීසිටින හෙයිනි. පෙර පාසල ඉගෙනුම සංවර්ධනය සඳහා (ශාරීරික සහ මානසික) ක්‍රියාකාරකම් සමඟ සබැඳි නිදහස්, විනෝදාත්මක පරිසරයක් නිර්මාණය කරයි.

අධ්‍යාපනයේ මූලික අරමුණ දරුවා ශික්ෂණය කිරීම සහ ඔහුගේ හෝ ඇයගේ ස්වාභාවික ගුණාංග හැකිතරම් ආරක්ෂා කරගැනීමයි. මේ සඳහා ප්‍රංශ දාර්ශනික රූසෝ සිය පරිකල්පනයෙන් එවන් ශිෂ්‍යයකු නිර්මාණය කර එමලි නමැති චරිතය ඉදිරිපත් කරයි. එමලි ස්වාභාවික ලෝකයේ රඳවා ගෙන සංකීර්ණ සාමාජයක ස්ථානගත කිරීම සැබවින් ම විසංවාදී සැලසුමකි. මෙම ගැටලුව යථාර්ථයක් නොවන වග රූසෝ පිළිගනී. එමඟින් බලාපොරොත්තු රහිත ගැටුම්කාරී (ප්‍රචණ්ඩකාරී) පුදුගලයකු බිහිවන වග හෙතෙම අවධාරණය කළේය. එහෙත් හෙතෙම සමාජයට ඉදිරිපත් කළේ එමලි මඟින් දරුවා ශික්ෂණය කිරීමට ප්‍රායෝගික මඟ පෙන්වීමක් නොව නො වැළැක්විය හැකි ගැටුමක් පිළිබඳ විශ්ලේෂණාත්මක දර්ශනයකි.

19 වන සියවස දී යුරෝපයේ බොහෝ අධ්‍යාපනඥයෝ බ්‍රිතාන්‍යයේ රොබට් ඔවන්,[1] ස්විස්ටර්ලන්තයේ ජොහාන් හෙන්රිච් පෙස්ටලොෂි, ජර්මනියේ ෆ්‍රෙඩ්රිච් ෆොබල් සහ ඉතාලියේ මාරියා මොන්ටසෝරි මුල් ළමාවිය සංවර්ධන පාසල් ක්‍රම ආරම්භ කළහ. මුල් ළමාවිය සංවර්ධනය යනු මානව සංවර්ධනයේ මූලික ව දරුවාට සිය ප්‍රජාව සහ සමාජය සමග අන්තර්සබඳතා සහ අන්තර්ක්‍රියා ගොඩනගා ගැනිමට අපේක්ෂාවක් ලබා දෙන ඉතා දුෂ්කර ව්‍යායාමයකි. කපු කර්මාන්තශාලා සේවය කළ දුප්පත් කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ දරුවන් සඳහා ප්‍රථම පාසල රොබට් ඔවන් ආරම්භ කළේය. ෆ්‍රෙඩ්රිඩ්ච් ෆොර්බල් ප්‍රථම ළමා උද්‍යානය "kindergarten"[2] යනුවෙන් ආරම්භ කළේය. එමගින් නිරමාණශිලිත්වය, භාෂා කුසලතා, සමාජ සබඳතා සංවර්ධනය කළේය. පෙර පාසල් අධ්‍යාපනය ළදරුවියේ සිට වසර පහ දක්වා පවත්වාගෙන යාමට nursery School, day care සහ Kindergarten විවිධ ක්‍රමවේද යටතේ යොදාගන්නා වග දක්නට ලැබේ. 1870 දී උපත ලද මාරියා මොන්ටිසෝරි [3] ඉතාලියේ වෛද්‍ය විද්‍යාව සඳහා උපාධිය (1890) ලබාගත් ප්‍රථම කාන්තාව වූවාය. 1904-1908 වසරේ දී රෝම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අංශයේ කථිකාචාර්යවරියක වූවාය. දෙමාපියන් වෘත්තීන් හි යෙදෙන හෙයින් දිවා කාලයේ දරුවන් සඳහා අධ්‍යාපන ක්‍රමවේදයක් Children's house (1907) හඳුන්වාදීමට ඇය පෙරමුණ ගත්තාය. 20 වන සියවස දී මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනය මනෝවිද්‍යාත්මක ප්‍රවේශයකින් ගුණාත්මක ව වර්ධනය කිරීමට ජීන් පියාජේ [4] සමත් විය. පවුල ඉක්මවා දරුවා සමාජගත කිරීම සහ ශික්ෂාකාමී මානවයා හැඩගැසීම මෙම සෑම ප්‍රයත්නයක ම මූලික අරමුණ විය.

1. Robert Owen 14 May 1771 – 17 November 1858), a Welsh textile manufacturer, philanthropist and social reformer, was one founder of utopian socialism and the cooperative movement. He is known for efforts to improve factory working conditions for his workers and promote experimental socialistic communities and supported the passage of child labor laws and free co-educational schools.
2. The word kindergarten comes from the German language. Kinder means children and gaten means garden. The term dates back to the 19th century. Friedrich Froebel (1782-1852) started the first kindergarten, Garden of Children, in 1840. Before 1840, children under the age of 7 did not attend school.
3. Maria Montessori was born on the 31st August 1870 Italy. When Marial graduated secondary school, she became determined to enter medical school and become a doctor 1896. In 1901 Maria began her own studies of educational philosophy and anthropology, lecturing and teaching students. Maria was offered the opportunity to introduce her material and practice to 'normal' children. There, in 1907, she opened the first Casa dei Bambini (Children's House) bringing some of the educational materials she had developed at the Orthophrenic School.
4. Jean Piaget 9 August 1896 – 16 September 1980) was a Swiss psychologist known for his work on child development. Piaget's 1936 theory of cognitive development and epistemological view are together called "genetic epistemology". Piaget placed great importance on the education of children.

## මුල් ළමාවිය (අර්ථකථනය)

අන්තර්ජාතික අර්ථකථනයට අනුව තවමත් විධිමත් (අධ්‍යාපන) පාසලට ඇතුළත් නොවන දරුවා මුල් ළමාවිය (වසර 3-6 දක්වා) අධ්‍යාපනය සඳහා සුදුසු යැයි දැක්වේ. මුල් ළමාවිය යනු අධ්‍යාපනික ව ධනාත්මක මැදිහත්වීමක් අවශ්‍ය කාලයක් වන අතර, මානසික සහ ශාරීරික සංවර්ධනයේ දී ජීවත්වන පරිසරය ඉතා සක්‍රීය බලපෑමක් ඇති කරයි. එය පසු කාලීන ව දරුවාගේ ජීවිතයට ශක්තිමත් පදනමක් සකසයි. අනෙකා සමඟ ජීවිතය බෙදාගැනීමේ (අන්තර්සබඳතා) සමාජ අගයන් සඳහා විවෘතවීම, ලෝකය පිළිබඳ කුතුහලය, නිරීක්ෂණය, ප්‍රශ්න කිරීම, සැසඳීම, අත්හදා බැලීම් සහ අනුකරණය මෙම වයස් කාලයට අයත්වේ. මෙම නිර්වචනයට අදාල වයස් සීමාව රටවල් අනුව වෙනස් වේ. ඒ අනුව මව් කුස පිළිසිඳගැනීමේ සිට ශ්‍රී ලංකාවේ විධිමත් පාසලට ඇතුළත් කර ගැනීමේ වයස් සීමාව වූ අවුරුදු පහ දක්වා කාලපරිච්ඡේදය මෙම ප්‍රතිපත්තිය සඳහා මුල් ළමාවිය වශයෙන් නිර්වචනය කෙරේ. (මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2018 [5] - ළමා ලේකම් කාර්යාලය - 2019) දරුවකුගේ පෙර පාසල් අවධිය වශයෙන් සැළකෙන අවුරුදු 3 සිට අවුරුදු 5 සම්පූර්ණ වන තෙක් කාලසීමාව ළමාවිය සංවර්ධනය සඳහාත් නිසිමඟ පෙන්වීම සඳහාත් වූ වයස යැයි ඌව පළාත් සභාවේ 2011 අංක 5 දරන පෙර පාසල් ප්‍රඥප්තියේ [6] සඳහන් වේ. වයස අවුරුදු 2 ½ - 5 සිට පාසල් යන වයස දක්වා කාලය පූර්ව ළමාවිය සංවර්ධන අවධිය යැයි උතුරු පළාත් සභා පෙර පාසල් ප්‍රඥප්තියේ [7] සටහන් වේ. දරු උපතේ සිට වසර 5 දක්වා කාලය පෙර පාසල් සමය යැයි මධ්‍යම පළාත් සභා පූර්ව ළමාවිය සංවර්ධනය ප්‍රඥප්තියේ [8] සඳහන් වේ.

## මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය

මුල් ළමාවිය දරුවාගේ උපතේ සිට වසර අට දක්වා කාලය යැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය UNESCO අර්ථ දක්වයි. එම කාලය දරුවාගේ මොළයේ වර්ධනය ඉතා උසස් මට්ටමක පවතියි. මෙම සමය දරුවාට පරිසරය සහ අන්තර් සමාජ සබඳතා කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි. එහෙයින් මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය දාර්ශනික ප්‍රවේශයකින් යොමුවිය යුතු තීරණාත්මක අවධියකි. දරුවාට ජීවිත කාලය පුරා ඉගෙනුම සහ ඉතා ශක්තිමත් මානවීයත්වයේ පුළුල් පදනමක් ගොඩනැඟීම සඳහා සමාජ සබඳතා, චිත්තාවේගය, සංජානනය සහ ශාරීරික අවශ්‍යතා සමස්ථව වර්ධනය කිරීමත් සමාජයට ඵලදායී දක්ෂ නිපුණතා සහිත අනාගත මානවයා පෝෂණය කිරීම එහි මූලික අරමුණයි. ජනතාව පිළිබඳ නිෂ්චිත අදහසක් ඇති රාජ්‍යයකට අනාගතය සඳහා කළ හැකි හොඳම ආයෝජනය මුල් ළමාවිය සංවර්ධනයයි. මානව සම්පත් සංවර්ධනය, ස්ත්‍රී - පුරුෂ සාමානාත්මතාව සහ සමාජ සහජීවනය ප්‍රවර්ධනය කෙරෙන පිරිවැය එමගින් අඩුකර ගත හැක. යුනෙස්කෝවේ [9] 2030 ඉලක්ක ගත න්‍යාය පත්‍ර නම් සියලුම ගැහැණු සහ පිරිමි ළමුන්ට ගුණාත්මක මුල් ළමාවිය සංවර්ධනය, රැකවරණය සහ පූර්ව-ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීම සහතික කිරීමයි.

## 21 සියවසේ අධ්‍යාපනය

21 සියවසේ අධ්‍යාපනය සිසුවාට නව ලෝකයේ සක්‍රීය නිපුණතා සහිත මානවයෙකු වීමට අවශ්‍ය කුසලතා ලබාදීමට අධ්‍යාපනය සමත් විය යුතුය. එමෙන්ම ඔවුන්ගේ ස්වයං විශ්වාසය සහ සාමූහික බැඳීම වැනි මානව හැකියා වර්ධනයට ප්‍රායෝගික සහාය ලබාදිය යුතුය.

## අධ්‍යාපන තේමා

- නිර්මාණශීලිත්වය - පරිකල්පනය මෝදුකිරීම.
- විචාරාත්මක චින්තනය - දාර්ශනික ප්‍රවේශයකින් මානව දැක්ම සැකසීම.
- සන්නිවේදනය - නිවැරදි තොරතුරු සම්පාදනය සහ බෙදාගැනීමට සහායවීම.
- සහයෝගිතා සහ සමානාත්මතාව - නව මානව වාදයකින් එකිනෙකට ප්‍රේම කිරීමට ඉගැනීම.

5. අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කරන ලද දිනය 2019 මාර්තු 19 - අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 19/0655/125/003

6. 2011 අංක 5 දරන ඌව පළාත් සභාවේ මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තිය - 2011 මාර්තු 24 පළාත් සභාව සම්මත කර 2011 අප්‍රේල් 11 දින ආණ්ඩුකාරවරයා අනුමත කර ඇත.

7. Northern Province Pre-School Education Statute No, 03 of 2015 June 09th

8. Central Province Provincial Council – Early Childhood Development Charter No, 03 of 2015 – 17th November 2015.

9. UNESCO’s approach is reinforced in the Education 2030 agenda and in … care and pre-primary education so that they are ready for primary education..’ www.unesco.org

මෙම අධ්‍යාපන තේමා සෑම විෂයයක ම අන්තර්ගත අන්තර් ක්‍රියාකාරී ඒකකයන් වන අතර, විෂයමාලා සංවර්ධනයේ දී සහ සැලසුම් කිරීමේ දී උක්ත තේමා වෙත අවධානය යොමුවිය යුතුය. නිර්මාණශීලීත්වය සහ පරිකල්පනය අවදිවීමෙන් නව සමාජ සබඳතා සක්‍රීය වන අතර, උද්ගත වන ගැටලු නිරාකරණයේ දී මහත් සහනයක් මෙන්ම සංතෘෂ්ටියක් ළඟා කර දෙයි. එමෙන් ම තොරතුරු විශ්ලේෂණයේ දී ස්වයං ගවේෂණයකට මංපෙත් සලසයි. සහසබඳතාව මත සාමූහික ඉගෙනුම සඳහා අත්වැලක් සපයයි.සහකම්පනය සහ සංවේදිතාව මානව සබඳතා ගොඩනැගීමෙ දී තෘප්තිමත්, ඵලදායී සෞන්දර්යාත්මක ප්‍රවේශයකට යොමු කරයි. අධ්‍යාපනය නිරතුරු ව ශිෂ්‍යයා ස්වයං සහ සමාජ පරිවර්තන හැකියා සඳහා යොමු කළ යුතුය.

- උපතේ සිට වසර හය දක්වා දරුවා ශාරීරික ක්‍රියාකාරකම් (සමබරතාව) - විශේෂයෙන් ම සියුම් චාලක කුසලතා සංවර්ධනය භෞතික (ශාරිරික) සංවර්ධනය Physical development යනුවෙන් හැඳින්වේ.
- සංජානනය සහ සංවේදක සංවර්ධනය Perception and sensory development - ඉන්ද්‍රියයන් මඟින් සන්නිවේදන කුසලතා සංවර්ධනය.
- ශබ්ද සහ දිසිරූප උත්තේජනය - විශේෂයෙන් ම භාෂාව, සිතිවිලි සහ හැඟීම් - දැනීම් හුවමාරුව මඟින් තොරතුරු ලබාගැනීමේ හැකියාව සහ භාෂා සංවර්ධනය Communication and language development.
- ප්‍රජානන සංවර්ධනය Cognitive development - ස්වයං සිතිවිලි සහ ප්‍රතිචාර දැකිවීමේ හැකියාව .
- චිත්තවේග සංවර්ධනය Emotional Development - දරුවන්ගේ දැනුවත්භාවය සහ ඔවුන්ගේ හැඟීම් පාලනය කිරීම, බහුවිධි තත්වයන් යටතේ එම හැඟීම් වලට ප්‍රතිචාර දැක්වීම.
- සමාජ සංවර්ධනය Social Development - දරුවාගේ අනන්‍යතාව, අන් අය සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවය සහ සමාජ පරිසරයක් කුළ ඔවුන්ගේ ස්ථානය අවබෝධ කර ගැනීම.

## ධරණීය සංවර්ධනය සඳහා අධ්‍යාපනය

ධරණීය සංවර්ධනය සඳහා අධ්‍යාපනය යහපත් අනාගතයක් සඳහා සෑම මානවයෙකුට ම දැනුම කුසලතා චර්යාවන් සහ සමාජ අගයන් අත්පත්කර ගැනීමට අවස්ථාව උදාකරයි. දේශගුණික වෙනස, ආපදා අවදානම අවමකිරීම, ජෛවවිවිධත්ව සංරක්ෂණය, දූප්පත්කම අවකරණය, ධරණීය පරිභෝජනය, ඉගැනිවීම සහ උගැනීම මෙහි අපේක්ෂාවයි. එමෙන්ම සහභාගිත්ව ඉගෙනුම සහ ඉගැන්වීමේ ක්‍රමවේද සඳහන්වන අතර, ඉගෙනුමලබන්නා බලසතුකිරීම සහ ඔවුන්ගේ හැසිරීම් උක්ත අරමුණ වෙනුවෙන් සංවර්ධනය කරනු ලැබේ. විචාරාත්මක චින්තනය, අනාගත පරිකල්පනය, සාමූහික තීරණගැනීමේ හැකියාව වර්ධනය කරයි.[10]

## ගුණාත්මක අධ්‍යාපනය සහ ඉගැන්වීමේ ක්‍රමවේද

ගුණාත්මක සහ විශේෂාත්මක අධ්‍යාපනයේ දී පුහුණු ගුරුවරයා (පහසුකාරකයා) ඉතා වැදගත් චරිතාංගයකි. සිසුවාගේ දැනුම පරිසරය සහ සංස්කෘතික පෙළගැස්ම අනුව ඉගැන්වීමේ ක්‍රමවේද විවිධාකාර වේ. සියලු සිසුන්ගේ දැනුම, නිපුණතා සහ ආකල්ප එක සමාන නොවේ. සෑම සිසුවෙක්ම අධ්‍යාපනයේ දී විශේෂිතය. ඔහුගේ හෝ ඇයගේ විශේෂත්වය ගුරුවරයා අවබෝධ කර ගත යුතුය. ගුරු භූමිකාව පහසුකම් සැලසීමයි. සාර්ථක ඉගෙනුම් ක්‍රියාවලියක් සඳහා තනි පුද්ගල අවශ්‍යතා හැඳින උපදේශ නවීකරණය කළ යුතුය. ඉගෙනුම ලබන්නාගේ චුවමනාව සහ පිළිගැනුමට ලක්වන ස්වාභාවික දෑ භාවිත කළ යුතුය. ඉගෙනුම ලබන්නගේ මනස, දෑස සහ දෑත නිදහස් කළ යුතුය. විෂයය පිළිබඳ යාවත්කාලීන දැනුම, මනා ශික්ෂණය, උද්යෝගය සහ මානව සහ පරිසර ප්‍රේමය අත්‍යවශ්‍ය අංගයකි.

## ඉගැනුම් පරිසරය

නිරෝගී පරිසරය, සෞඛ්‍ය සහ පෝෂණය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ඉගෙනුම ලබන ස්ත්‍රී-පුරුෂ දෙපිරිසටම සමානාත්මතාව අභ්‍යාස කළ හැකි ස්ථානයක් විය යුතුය. පාසල ඉතා සංවිධානාත්මක මනා කළමනාකරණයෙන් යුතු, සෑම දරුවකුගේම පුද්ගලිකත්වය ආරක්ෂාවන, ගුරු-දෙගුරු-සිසු සබඳතා උසස් ප්‍රමිතීන් සහ කාර්යයසාධනය, ඇගයුම, විෂයමාලා යාවත්කාලීන වීම, බහු සංස්කෘතික සහයෝගිතාව, ඉගෙනුම් ක්‍රියාවලියේ දී අතිශයින්ම වැදගත්ය.

10.http://www.unesco.org/new/en/education/themes/leading-the-international-agenda/education-for-sustainable-development/

## පෙරපාසල් අධ්‍යාපනය

පෙරපාසල් හෝ ළදරු අධ්‍යාපනය මානව ඉගෙනුම් ක්‍රියාවලියේ මූලික පදනමයි. දරුවා ජීවිතයේ ප්‍රථමවරට ශික්ෂණ ප්‍රවාහයකට යොමු කිරීමේ දී සංවිධිත සහ විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කල යුතුය. අධ්‍යාපනය යනු pedagogy ශික්ෂණ විද්‍යාවකි. දරුවා නිවැරදිව භාෂාව හැසිරවීමට ඉගැන්වීම වැඩිහිටි පරම්පරාවේ වගකීමකි. එය විද්‍යානුකූල ප්‍රවේශයකි. පෙරපාසල, දෙමාපියන් සහ අධ්‍යාපනඥයන් මෙම යථාර්ථය අවබෝධ කර ගෙන ජීවිත කාලය පුරා ඔහුට හෝ ඇයට අවශ්‍ය කුසලතා හැදින, විධිමත් ශික්ෂණයකින් දරුවා මෙහෙයවා ගත යුතුය. කුඩා දරුවන් පාසල් අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීමේ දී සංවර්ධනය වූ සහ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් අතර අසමානතා දක්නට ලැබේ.

## ගැටලු සහ දූර්වලතා

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය අධ්‍යාපනය අවිධිමත් අධ්‍යාපන ක්‍රමයකි. විවිධ රාජ්‍ය සහ රාජ්‍යනොවන ආයතන මෙන්ම පුද්ගලයෝ තම තම දැනුම් මට්ටමට ළදරුවන් අවිධිමත් ඉගැන්වීමේ කාර්යට ගොනු කරති.

- ජාතික මට්ටමේ පිළිගත් රාජ්‍ය ප්‍රතිපත්තියක් නොතිබීම.
- යාවත්කාලීන වන විෂයය මාලාවක් නොතිබීම.
- ගුරුවරයාට ක්‍රමවත් සහ විධිමත් පුහුණුවකට යොමු නොකිරීම.
- අධ්‍යාපන මධ්‍යස්ථාන මෙන්ම ගුරුවරයා ප්‍රමිති ගත නොවීම.
- දෙමාපිය ගැටලු වෙත අවධානය යොමු නොවීම.
- ඉගෙනුම් ක්‍රමවේදය පිළිගත් ගෝලීය සහ ස්ථානීය පදනමත් මත සැලසුම් නොවීම.
- දෙමාපියන් සහ ගුරු සබඳතාව ක්‍රමවත්ව ගොඩනැගෙන සංවිධානාත්මක ව්‍යුහයක් නොතිබීම.
- ඇගයුම් සහ මෙහෙයුම් නියාමනයක් නොමැතිවීම.
- පහසුකම් හා සේවා අවම මට්ටමක පැවතීම.
- සෞඛ්‍යය, ආරක්ෂාව සහ පෝෂණය ගැන රාජ්‍ය අවධානය ප්‍රමාණවත් නොවීම.
- විධිමත් පාසල් අධ්‍යාපනය සමඟ සමගාමී නොවීම.
- මෙම ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සහ සාකච්ඡා ප්‍රමාණවත්ව සිදු නොවීම.

## පිළියම් සහ යෝජනා

අධ්‍යාපනය ස්ථිරවශයෙන්ම උද්යෝගිමත්, කාරුණික සහ ආදරණීය ක්‍රියාවලියකි. එහෙයින් ඉගැන්වීම තුළ ආදරය අභ්‍යාස කිරීම ඉතා වැදගත්ය. මනුෂ්‍යත්වය ළදරු වියේ සිට ප්‍රායෝගීක ව ඉගෙන ගත යුතුය. එය උපතින් ලැබෙන දායාදයක් වුව ද සමාජ ව්‍යාකූලත්වය නිසා මානවයාගේ මනුෂ්‍යත්වය ස්වාභාවික ව වර්ධනය නොවේ. සෑම පරම්පරාවක් විසින් ම මනුෂ්‍යත්වය නැවත නැවත අර්ථකථනය කළ යුතු ප්‍රවාහයකි. දරුවාගේ හෝ ඉගෙනුම ලබන්නාගේ සර්වාංගය ම සමාජ ඵලදායකත්වය උදෙසා ශික්ෂණය කළ යුතුය. හැසිරීමේ රටාව ශික්ෂණය කිරීම යනු බුද්ධිමත්භාවයේ ගුණාංග වැඩි දියුණු කිරීමයි. පහසුකම් සලසන්නා හෝ මැදිහත්වන්නා (ගුරුවරයා) යනු නිර්මාණකරුවෙකි. පෙරපාසල යනු නිර්මාණකරණයේ පළමු මහපෙන්වන්නා හෙවත් ගුරුවරයාය.

- පොදු මාර්ගෝපදේශන ප්‍රතිපත්තියක් සහ විෂයමාලාවක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- නියමිත කාලරාමුවකට අනුව නිවැරදි ප්‍රමිතියකට යටත්ව ගුරුවරයා පුහුණුවකට යොමු කිරීම.
- ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වාර්ෂික බලපත්‍රයක් මත ලියාපදිංචි කිරීම.
- දරුවා පිළිබඳ වාර්තාවක් ආරම්භයේ සිට අඛණ්ඩව පවත්වාගෙන යාමට සෑම ආයතනයක්ම යොමු කිරීම.
- මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධනය සඳහා ජාතික හෝ පළාත් බඳ පුහුණු ආයතන පිහිටුවීම.
- අවශ්‍යතා අනුව දෙමාපියන් දැනුවත් කිරීම.
- මාධ්‍යය භාවිතයේ දී මුල් ළමාවිය සංවර්ධනයට බාධා පමුණුවන සහ වෙළඳ දැන්වීම් වෙත දරුවා පෙළඹවීම වැළැක්වීම සඳහා රාජ්‍ය අවධානය යොමු කිරීම.
- දරුවාගේ මානසික සහ ශාරීරික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය ආහාර සංස්කෘතියක් හඳුන්වාදීම.
- මෙම ක්ෂේත්‍රය සම්බන්ධව අඛණ්ඩව විධිමත් පර්යේෂණ, සමීක්ෂණ සහ ඇගයුම් සිදු කර ඒ පිළිබඳව නිශ්චිත තීරණ ගැනීමට යොමු කිරීම.

## අවධානය සඳහා

- ළදරුවාගේ චාලක සංවර්ධනයේ motor development දී ඔහුගේ හෝ ඇයගේ කුසලතා සංවර්ධන වයසට අනුව පෙළගැසෙන කාල රාමුව හොඳින් අවබෝධ කර ගැනීම දෙමාපියන්ගේ සහ පහසුකම් සලසන්නාගේ වගකීමකි. පැන්සල හෝ පාට කූරක් (crayon) සියුම් ඇඟිළිතුඩු වලින් අල්ලාගැනීමට දරුවාගේ මාංශපේෂීන් තවමත් වර්ධනය වී නොමැති නම් එහි අරුත ළදරුවා තවමත් වචන ලිවීමට සූදානම් නොමැති බවයි. වයස අවුරුදු තුන සම්පූර්ණ කළ ළදරුවා තරමක් විශාල පාට කූරු පැන්සල් අතින් අල්ලාගැනීමට ඇතැම්විට සමත්වනු ඇත. එම කුසලතාව වර්ධනය වන්නේ මැටි ඇනීම සහ වෙනත් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රායෝගික ව අත්විඳීමෙනි. විශාල චිත්‍ර සටහන් ඇඳීමෙන් දරුවා අනාගත අවශ්‍යතා සඳහා යොමු කළ හැකිය. දරුවාට චිත්‍ර ප්‍රෙහේළිකා - ක්‍රීඩා - වර්ණ ගැළපීම් කියාදීමෙන් එම ක්‍රියාකාරකම් හඳුනාගැනීමට දරණ උනන්දුව මත දරුවාගේ කුසලතා හඳුනාගත හැක. සොබාදහම හඳුනාගැනීමට දරුවා නිදහස් කළ යුතුය. සොබාදහමේ වස්තූන් හඳුනාගැනීමත් ඒවායේ නාම සහ ක්‍රියාකාරීත්වයන් අවබෝධ කර ගැනීමට උනන්දුවීමත් නිසා නිදහසේ කුසලතා සංවර්ධනය වෙයි.

- පෙරපාසල් ගුරුවරයාට මුල් ළමා විය සංවර්ධන මූලිකාංග පිළිබඳ පුළුල් දැනුමක් මෙන්ම මනා ශික්ෂණයක් තිබිය යුතුය. එමඟින් දරුවන්ගේ විවිධත්වය අවබෝධ කර ගැන්ම ශාරීරික සහ මානසික වර්ධනයට අවශ්‍ය මූලික අවශ්‍යතා ඉටුකිරීමට පෙරමුණ ගත යුතුය. ඒ ඒ දරුවාගේ සුවිශේෂත්වය මත ඉලක්ක කරා මෙහෙයුම මුල් ළමාවිය සංවර්ධනයේ මූලිකාංගයකි. සොබාදහම ගවේෂණයෙන් දරුවා ස්වාධීන වේ. සිය අවශ්‍යතා ඉටුකරගැනීමට දරුවා මෙහෙයවීමෙන් ඔහු හෝ ඇය තුළ ක්‍රමයෙන් ස්වයං අභිමානය වර්ධනය වේ. පෙරපාසල් සමය සංජානන සංවර්ධනය උත්තේජනය කිරීමට සහ දරුවන්ට මූලික කුසලතා ලබාගැනීමට උපකාරී වන හොඳම කාලයයි. මුල් ළමාවිය අධ්‍යාපනයේ දී ගුරුවරුන් ඉගෙනීමේ අරමුණු දිනපතාම ඔවුන්ගේ පාඩම් සැලසුම් වලට ඇතුළත් කළ යුතුය. මෙම කුසලතා පුනරාවර්තනය කිරීම පෙර පාසල් දරුවන් පාසලට යන විට විශ්වාසයක් ඇති කර ගැනීමට උපකාරී වේ. සංජානන අරමුණු ඉගෙනීම සඳහා උත්තේජනයක් ඇති කරන අතර පෙර පාසල දරුවන්ට සරල සාක්ෂරතාව, ගැටළු විසඳීම සහ වෙනත් මූලික දැනුම පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වේ.

- පෙරපාසල් ගුරුවරයා දරුවාගේ බහුවිධ කුසලතා සංවර්ධනය ප්‍රධාන ඉලක්කය ලෙස සිය අවධානය යොමු කළ යුතුය. භාෂා සංවර්ධනය දරුවාට ඉගෙනුම සඳහා උත්තේජනයක් ලබා දෙයි. වචන, ශබ්ද, අකුරු සහ සංකල්ප පිළිබඳ අවබෝධයක් ඔවුන් වර්ධනය කර ගන්නා විට සන්නිවේදනය සහ ප්‍රශ්න ඇසීමේ හැකියාව ඉතා වැදගත් වේ. පෙරපාසල් දරුවන් සඳහා භාෂා ඉලක්කයක් ලෙස වාග් මාලාව පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සහ සංවාදය කෙරෙහි උනන්දුව වැඩිදියුණු කළ යුතුය.

- 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ පළාත් සභා වෙත බලය විකේන්ද්‍රණය කිරීමේ සංකල්පය මත එම පළාත වෙත අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීමේ බලය හිමි විය. බොහෝ පළාත් සභා (වයඹ, ඌව, මධ්‍යම, සබරගමුව, උතුරු) ළමා සංවර්ධන මධ්‍යස්ථාන පෙරපාසල් ප්‍රඥප්ති නෛතිකව ස්ථාපිත කර ඇත. එමෙන්ම 2018 වසරේ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ඇත. එම ලේඛන මත ඉතා සාධනීය ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග දක්නට ලැබේ. සෑම පළාත් ප්‍රඥප්තියක ම සිය වපසරිය තුළ ඇති පෙරපාසල් එම පළාත් සභාවේ ලියාපදිංචි විය යුතු යැයි අවධාරණය කර ඇත.එහෙත් එම ලියාපදිංචිය සඳහා නිශ්චිත කාලරාමුවක් දක්නට නො ලැබේ. සෑම පෙරපාසලක් ම පළාත් සභාවේ ලියාපදිංචි විය යුතු අතර, ඒවා නියාමනය කිරීම එම පළාත් සභාව සතු මෙහෙවරකි. මෙහිදී පෙරපාසල පිහිටි පරිසරය, දරුවාගේ ඉගෙනුමට නිදහස් වටපිටාවක් සකසන්නේ ද යන්නත් ගුරුවරයාගේ සුදුසුකම්, ඉගැන්වීමේ ක්‍රමෝපායන්, සෞඛ්‍යය ආරක්ෂාව ආදියත් ගැන විමසිලිමත් වියයුතුය. එමෙන් ම වාර්ෂිකව සියලු සුදුසුකම් සපුරා ඇති පෙරපාසලකට බලපත්‍රයක් ලබාදීම මැනවි. එහිදී පෙරපාසලේ ප්‍රමිතිය ඇගයුමකට ලක්වන අතර, එම සුදුසුකම් සපුරාගැනීමට යම් සහන කාලයක් ද ලබාදිය හැකි වේ.

⌘

11. මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2018. අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2018 මාර්තු 19.

## විස්වත් කමිටුව

**මහාචාර්ය කපිල ගුණසේකර**
හිටපු උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**ආචාර්ය ටියුඩර් වීරසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රීපාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

**ආචාර්ය සුනිල් රණසිංහ**
මානවවිද්‍යා පර්යේෂක

**ආචාර්ය ජයන්ත වත්තෙවිදාන**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

**ආචාර්ය මාලිනී මුණසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

වරලත් ඉංජිනේරු **ස්ටැන්ලි හෙට්ටිආරච්චි**

වරලත් වාස්තුවිද්‍යාඥ **සිතුමිණි රත්නමලල**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය

**සෙනේෂ් බණ්ඩාර දිසානායක**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**අනුෂා ගෝකුළ ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජනරාල්, මිනිස්බල සහ රැකී රක්ෂා දෙපාර්තමේන්තුව

**සුමිත් බී. පෙරේරා**
අධ්‍යක්ෂ (සැලසුම්, බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යාංශය)

## සහභාගිත්වය

**එල්.කේ.මුහන්දිරම්ගේ**
අධ්‍යක්ෂ, (මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ) වැ.බ

**එල්.පී.ලලිත් ගුණරත්න**
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)

**ඩී.එම්.එස්.ආර්.ටී.දිසානායක**
සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)

**එච්.ජී.කේ.දීපශිකා**
සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශ)

**රංජිත් වික්‍රමසිංහ**
කළමනාකරන සහකාර

**නිලූෂිකා අතුකෝරල**
සංවර්ධන නිලධාරී